**සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනය - 2023**

**------------------------------------------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරී මෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම් කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන පොදු ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ ඇතුළත් මෙහෙයුම් අත්පොතෙහි 2.2.5 වගන්තිය සහ 2023 සැප්තැම්බර් 27 දිනැති අංක PED/01/2021(ii) සහ අංක PED/01/2021(iii) දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් අත්පොතෙහි 2.3 වගන්තිය සහ 7.7 වගන්තිය | ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාතනය විසින් සකස් කරන ලද මූල්‍ය හා මෙහෙයුම් අත්පොත සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | NSBM විසින් දැනට යෝජිත පාලන ව්‍යුහය වැඩිදියුණු කිරීමේ ඇඟවීම් වලට අනුකූලව ආයතනයේ මෙහෙයුම් අත්පොත් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින බව. අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගනු ලබන බව. | යොමුගත මාර්ගෝපදේශ වලට අනුව මූල්‍ය හා මෙහෙයුම් අත්පොත සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (i) | රාජ්‍ය ව්‍යාපාර සහ පොදු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.2v ඡේදය | රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත පමණක් දිරිගැන්වීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ යුතු වුවද, විගණන දිනය වන 2024 පෙබරවාරි 12 දින දක්වාම ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාතනය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සාංගමික ව්‍යවස්ථාවලියට අනුව සමාගමේ ව්‍යාපාර සහ කටයුතු කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය සියලු බලතල අධ්‍යක්ෂ මණ්ඩලය සතු විය යුතුය. දිරි දීමනා ගෙවීම සඳහා අවශ්‍ය සියලුම අනුමැතීන් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබාගෙන ඇති බව. | යොමුගත මාර්ගෝපදේශ අනුව දිරි දීමනා යෝජනා ක්‍රමය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | රාජ්‍ය ව්‍යාපාර සහ පොදු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.1 සහ 3.2 වගන්ති | විද්‍යාතනයේ භාවිතා කරනු ලබන නිශ්චිත කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස්කිරීම් ක්‍රියා පටිපාටි සඳහා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය 2024 මාර්තු 31 දින දක්වාම ලබාගෙන නොතිබුණි. | සාංගමික ව්‍යවස්ථාවලියට අනුව සමාගමේ ව්‍යාපාර සහ කටයුතු කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය සියලු බලතල අධ්‍යක්ෂ මණ්ඩලය සතු විය යුතුය. | නිශ්චිත කාර්ය මණ්ඩලය සහ කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස් කිරීම් පටිපාටි සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා ගේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | 2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01 හා 2023 අප්‍රේල් 06 දිනැති අංක SEC/2023/E/02 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ චක්‍රලේඛ | අත්තිකාරම් පුද්ගලික ආදායම් බදු (APIT) ගණනය කිරීමේදී ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාතනය විසින් සපයන ලද නිල නිවාස, වාහන සහ ඉන්ධන වැනි මූල්‍ය නොවන ප්‍රතිලාභ සලකා බලා නොතිබුණි. | එහි දක්වා ඇති වාහන ප්‍රමුඛතා පදනම මත නිල ගමන් අවශ්‍යතා සඳහා පවරා ඇති අතර, කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා වාහන අනුයුක්ත කර නොමැති බව. නවාතැන් සඳහා එක් එක් සේවකයාගේ මාසික වැටුපෙන් මාසික කුලිය, විදුලි බිල්පත්, ජල බිල්පත් සහ රූපවාහිනී සම්බන්ධතා බිල්පත් කපා හරිනු ලබන බව. | චක්‍රලේඛ ප්‍රකාරව APIT ගණනය කළ යුතුය. |
| (ඇ) | ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාතනයේ II අදියර ව්‍යාපෘතියේ අනුමැතිය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සලකා බලන ලද ව්‍යාපෘති වාර්තාව, ආයෝජන සැලැස්ම සහ ශක්‍යතා අධ්‍යයන වාර්තාව | වසර තුනකට වරක් පමණක් පාඨමාලා ගාස්තු වැඩි කිරීමට යටත්ව ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාතනයේ II අදියර ව්‍යාපෘතිය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාතනය විසින් 2020 සහ 2021 වසරවලදී පාඨමාලා 12ක් සඳහා එක් වරක් ද පාඨමාලා 17ක් සඳහා 2022 සහ 2023 වසරවලදී දෙවතාවක්ද පාඨමාලා ගාස්තු සියයට 17 සිට සියයට 75 දක්වා වැඩි කර තිබුණි. | ඉදිරිපත් කරන ලද 2019 සහ 2020 වසර තුළ රටේ සමාජ ආර්ථික තත්ත්වය මත පදනම්ව ව්‍යාපෘති යෝජනාව 2020 ජූලි මාසයේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ බව. කෙසේ වෙතත්, පසුගිය වසර කිහිපය තුළ Covid 19 වසංගත තත්ත්වය, ආර්ථික අර්බුදය හා දේශපාලන වෙනස්කම් සිදු වීම හේතුවෙන් උපකල්පන බෙහෙවින් වෙනස් වී ඇති බව. | පාඨමාලා ගාස්තු වැඩි කිරීමේදී තත්‍ය පාඨමාලා පිරිවැය සහ සමාජ සාධාරණත්වය සලකා බැලිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2021 පෙබරවාරි 18 දින සංශෝධනය කරන ලද ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාතනයේ මූල්‍ය හා ගිණුම්කරණ මෙහෙයුම් අත්පොතෙහි 6.4 වගන්තිය | දේපල, පිරියත සහ උපකරණවල වාර්ෂික භෞතික සත්‍යාපනය සමාලෝචිත වර්ෂය තුළ දී සිදු කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 වන දිනට ස්ථාවර වත්කම් සත්‍යාපනය සහ ඉන් පසුව වූ එකතු කිරීම් 2023 වර්ෂය තුළ අතින් සිදු කරන ලද බව. NSBM හි ස්ථාවර වත්කම් මොඩියුලය 2024 වර්ෂයේදී මිල දී ගෙන ඇති අතර එය දැනටමත් සජීවී පරිසරයේ පවතින බව. ඉදිරි මාස 04 තුළ එම කාර්යය අවසන් කිරීමට කළමනාකාරිත්වය අපේක්ෂා කරනු ලබන බව. | එය අදාළ රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (ඉ) | මූල්‍ය සහ ගිණුම්කරණ මෙහෙයුම් අත්පොතෙහි 4.5.1 වගන්තිය | මාස 6 කට පෙර නිකුත් කරන ලද රු. 1,511,930ක් වූ චෙක්පත් 54ක් සම්බන්ධයෙන් අත්පොතට අනුව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වසර 1 කට පසු දිගුකාලීන පොදු ලෙජර් ගිණුමෙන් ආපසු ආදායමට ගැනීමට පෙර දිගුකාලීන නොවිසඳුණු අයිතම විමර්ශනය කරනු ලබන බව. වසර 1ක කාලයකට පසු කල් ඉකුත් වූ සියලුම චෙක්පත් සාමාන්‍ය ලෙජරයේ ගැලපීම් කර ඇති බව. | අදාළ රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 720,432,349ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. 190,744,927ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 529,687,422 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහනේ ගාස්තු ආදායම රු. 1,275,288,932කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රීඩා පිටියේ ටර්ෆින් ඉදිකිරීම, පොප්-අප් ස්ප්‍රින්ක්ලර් වාරිමාර්ග පද්ධතිය (Pop-up Sprinkler irrigation system) ස්ථාපනය කිරීම සහ උප මතුපිට ජලාපවහන පද්ධතිය (Installation of subsurface drainage system) ස්ථාපනය කිරීම සඳහා ලංසු කැඳවීම සඳහා "SP-3 සහ ඉහළ" CIDA Grade හි ලියාපදිංචි වූ ලංසුකරුවන් තෝරා ගත යුතු වුවද, ඒ අනුව ලංසුකරුවන් තෝරාගෙන නොතිබුණි. | රටේ පවතින ආර්ථික අර්බුදය සහ ඉදිකිරීම් කර්මාන්තයේ පවතින තත්ත්වය හේතුවෙන් මෙම පුවත්පත් දැන්වීමට ප්‍රතිචාර වශයෙන් ලංසු දෙකක් පමණක් අපට ලැබී තිබුණි . අයදුම් කළ ලංසුකරුවන් පිළිබඳ ඇගයීම් සිදු කිරීමේදී දෙදෙනාම පසුගිය කාලය තුළ සමාන ව්‍යාපෘති අවසන් කර ඇති බව. | අදාළ රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාතනය විසින් අනුමත ප්‍රසම්පාදන අත්පොත හෝ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි. | NSBM සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව, සමාගමේ ව්‍යාපාර සහ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයේ මහපෙන්වීම හෝ අධීක්ෂණය යටතේ කළමනාකරණය කළ යුතුය. සියලුම ප්‍රසම්පාදන කටයුතු මූල්‍ය අත්පොතට අනුකූලව සිදු කර ඇති බව. | රජයේ චක්‍රලේඛවලට අනුකූල විය යුතුය. |